(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 19.]

පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

2009 අගෝස්තු මස 06 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0058/'09

1.

ගරු රවි කරුණානායක මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාතුමාගෙන් ඇසීමට,— (2)

(අ) උතුරු පළාතේ සහ නැගෙනහිර පළාතේ පිහිටා ඇති මධ්‍යම රජයේ හෝ පළාත් සභාවල පාලනය යටතේ පවතින මුලු ඉඩම් ප්‍රමාණය කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශිකයන්ට (එම පුද්ගලයන් අයත් වන රට නම් කරන්න), සමාගම්වලට සහ තනි පුද්ගලයන්ට ලබා දුන් ඉඩම් කවරේද;

(ii) එම ඉඩම් ලබා දීමට අදාළ නියමයන් සහ කොන්දේසි, ඒවායේ වටිනාකම සහ ඒවා ලබා දෙන කාල සීමාව කවරේද;

යන්න උතුරු සහ නැගෙනහිර පළාත්වලට අදාළව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) දැනට පෞද්ගලික අංශය වෙත පැවරීමට, විකිණීමට හෝ බදු දීමට කටයුතු කෙරෙමින් තිබෙන රජයට අයත්ව තිබූ ආයතනවල නම් සහ ඒ සම්බන්ධයෙන් පනවා ඇති කොන්දේසි කවරේද;

(ii) ඒවා ලබා දීමට නියමිතව ඇත්තේ කවර කාල සීමාවන් සඳහා ද;

(iii) එම කොන්ත්‍රාත්වල වටිනාකම් කොපමණ ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0082/'09

2.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යාතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බස් ගාස්තු වැඩිකිරීමෙන් 2008 වර්ෂයේ ශ්‍රී ලංගමයේ ආදායම රුපියල් දශලක්ෂ 17,150 ක් දක්වා වැඩි කරගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එය ශ්‍රී ලංගමයේ පෙර වර්ෂයේ ආදායමට වඩා සියයට 16.8 කින් වැඩි කර ගැනීමක් බවත්;

(ii) බස් ගාස්තු වැඩි කිරීම නිසා ආදායම වැඩි වී තිබියදීත්, 2008 වර්ෂයේ දී ශ්‍රී ලංගමයේ මෙහෙයුම් අලාභය රුපියල් දශලක්ෂ 3554 දක්වා ඉහළ ගොස් ඇති බවත්;

(iii) මෙම අලාභය පෙර වසරට වඩා සියයට 53.8 කින් වැඩිවීමක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහත අධික අලාභය ලැබීමට හේතු කවරේද;

(ii) විෂය භාර අමාත්‍යාතුමා ලෙස මේ තත්ත්වය වෙනස් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0228/'09

3.

ගරු පේමසිරි මානගේ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඖෂධ මිල දී ගැනීමේ ටෙන්ඩර් ක්‍රියාපටිපාටියෙන් බැහැරව 2005 වර්ෂයේ දී Streptokinase Injection ඒකක 670 ක්, එකක් රුපියල් 5000 බැගින් මිල දී ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ දී Streptokinase Injection ඒකකයක සාමාන්‍ය මිල කොපමණද;

(ii) සිදු වූ පාඩුවේ මුල්‍ය වටිනාකම කොපමණද;

(iii) 2005 වර්ෂයේ දී සිදු වූ මුල්‍ය අක්‍රමිකතාවන්ට වගකිවයුතු පාර්ශ්වයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0267/'09

4.

ගරු බිමල් රත්නායක මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඛනිජ ද්‍රව්‍ය අපනයනකරුවන් සඳහා 2009 පෙබරවාරි මස 03 වැනි දින ඉන්ටකොන්ටිනෙන්ටල් හෝටලයේ දී වැඩසටහනක් පැවැත්වූයේද;

(ii) එසේ නම්, එහි අරමුණු කවරේද;

(iii) එහිදී සාකච්ඡා කළ කරුණු කවරේද;

(iv) එම සාකච්ඡාවට පැමිණි පුද්ගලයින්ගේ නම් කවරේද;

(v) අදාළ සාකච්ඡාව සඳහා මුදල් ලබාදුන්නේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0402/'09

5.

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— ග්‍රාමීය කර්මාන්ත හා ස්වයංරැකියා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ග්‍රාමීය කර්මාන්ත හා ස්වයංරැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකාවේ පවත්නා කාර්මික ජනපද සංඛ්‍යාව හා ඒ කවරේද;

(ii) එක් එක් කාර්මික ජනපදය තුළ ඇති කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2009 වර්ෂය ආරම්භ වන විට ක්‍රියාත්මකව තිබූ මේ වන විට සම්පූර්ණයෙන් වසා දමන ලද කර්මාන්ත ශාලා තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

(iii) 2009 වර්ෂය ආරම්භ වන විට ක්‍රියාත්මක වූ මේ වන විට සේවකයින් ඉවත් කරන ලද කර්මාන්ත ශාලා තිබේද;

(iv) එසේ නම්, ඒ කවරේද;

(v) වසා දමන ලද කර්මාන්ත ශාලා හිමිකරුවන්ට රජය මගින් යම් සහනයක් ලබා දී තිබේද;

(vi) ඉවත් කරන ලද සේවකයින් සඳහා ලබාදුන් සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0432/'09

6.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0063/'09

7.

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගුවන් යානා සහ නැව්වලට ශ්‍රී ලංකාවේ ලියාපදිංචිවීමට 2008.01.01 දින සිට ක්‍රියාත්මක වූ අය-වැය ලේඛනයෙන් සහන සලසා තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2007.12.31 දින දක්වා ලියාපදිංචි වූ නැව් සහ ගුවන් යානා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම සහන සැළසීමෙන් අනතුරුව එලෙස ලියාපදිංචි වූ නැව් සහ ගුවන් යානා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සහන සැළසීම නිසා අහිමිවූ ආදායම් ප්‍රමාණය කොපමණද;

(iv) එලෙස වෙනත් රටක පහසුකම් මත ලියාපදිංචිවීමේ සහනය ලබාදීම තුළින් අප ලබාගත් ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම සහන ලබාදීමෙන් අනතුරුව ලියාපදිංචි කරන ලද නැව් සහ ගුවන්යානා හිමිකරුවන්ගේ සහ කොටස්කරුවන්ගේ නම් කවරේද;

(ii) මෙහිදී ලබාගත් ප්‍රගතියේ මට්ටමට වඩා වැඩියෙන් පුද්ගලයන් ආකර්ෂණය කරගැනීමට නොහැකිවූයේ මන්ද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0083/'09

8.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2008 වර්ෂයේ දී දුම්රිය ගාස්තු ඉහළ දැමීම නිසා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ආදායම රුපියල් දශ ලක්ෂ 3,671 දක්වා සියයට 22.4 කින් වැඩි කර ගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එහෙත්, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මෙහෙයුම් අලාභය රුපියල් දශ ලක්ෂ 4,553 දක්වා සියයට 5.9 කින් 2008 වර්ෂයේදී ඉහළ ගොස් ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) දුම්රිය ගාස්තු වැඩි කිරීම නිසා ආදායම වැඩිවී තිබියදීත් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ අලාභය වැඩි වීමට හේතු කවරේද;

(ii) විෂයභාර අමාත්‍යතුමා ලෙස මේ තත්ත්වය වෙනස් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0229/'09

9.

ගරු පේමසිරි මානගේ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඖෂධ මිල දී ගැනීමේ ටෙන්ඩර් ක්‍රියාපටිපාටියෙන් බැහැරව 2003 වර්ෂයේ දී Spinal Needles ඒකක 1650 ක් මිල දී ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඒකක එකක් මිල දී ගත් මුදල කොපමණද;

(ii) 2003 වර්ෂයේ දී Spinal Needles ඒකකයක සාමාන්‍ය මිල කොපමණද;

(iii) Spinal Needles මිල දී ගැනීමේ දී සිදු වූ මූල්‍ය අක්‍රමිකතාවය ප්‍රමාණාත්මකව කොපමණද;

(iv) එම මූල්‍ය අක්‍රමිකතාවයට වගකිවයුතු පාර්ශ්වයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0230/'09

10.

ගරු පේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යාංශය භාර කැබිනට් අමාත්‍යතුමාගේ නම කවරේද;

(ii) ජාතිය ගොඩනැඟීමේ කැබිනට් නොවන අමාත්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව පසුගිය වසරේ කැඳවූයේ කවර දිනයන්හිද;

(ii) ඉහත උපදේශක කාරක සභාව 2009 වසරේ දී කැඳවනු ලැබුවේද;

(iii) එසේ නම්, ඒ කවදාද;

(iv) ඉහත උපදේශක කාරක සභාව කැඳවනු නොලබන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

ප්‍රධාන කටයුතු ආරම්භයේදී

පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,—පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන),— 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

2.

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,—සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන),— සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

යෝජනා පිළිබඳ දැනුම් දීම

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතුය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2009 අගෝස්තු මස 18 වැනි අහඹරුවාදා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

6.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තු සංකීර්ණයේ දැනට පවත්නා තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— පාර්ලිමේන්තු සංකීර්ණයේ දැනට පවත්නා තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා 2005 පෙබරවාරි මස 08 වැනි දින ගරු කථානායකතුමා විසින් පත් කරන ලද විශේෂ කාරක සභාවට තමා විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2009 පෙබරවාරි මස 05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව මගින් නියම කර ඇති කාල සීමාව ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට නොහැකි බැවින්, එම කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව අංක 96 දරන ස්ථාවර නියෝගය ප්‍රකාරව 2010 පෙබරවාරි මස 28 වැනි දින දක්වා දීර්ඝ කළ යුතුය.

7.

ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

" බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2009 අගෝස්තු මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

චත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*10.

අපරාධයක චින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*11.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*13.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*14.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*15.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*16.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*17.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

ගරු අග්‍රවිනිශ්චයකාරතුමා	රු. 70,000/-
	රු. 1,500/-
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති	රු. 65,000/-
අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්	රු. 63,500/-

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*21.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

ගරු අග්‍රවිනිශ්චයකාරතුමා	රු. 27,500/-
ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති	රු. 25,000/-
අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්	රු. 22,500/-

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*25.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*26.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

27.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

28.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

29.

පින සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

30.

ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩල (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

31.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

32.

ශ්‍රී ලංකා සත්ව අවිහිංසා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

33.

ශ්‍රී ලංකාවේ විදේශ මුස්ලිම් අධ්‍යාපන භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

34.

ලසන්ත අලගියවන්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

35.

අල්හාජ් අබ්දුල් ජවාද් ආලිම් වලියුල්ලාහ් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

36.

කොට්ටාව ශ්‍රී පුණ්‍යාභිවර්ධනාරාම විහාරස්ථාන කාර්යසාධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0381/'09

1.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 21 වැනි පිටුවේ (සිංහල මාධ්‍ය) යෝජනා කර ඇති පරිදි "ජන සෙවන" වැඩ සටහන් යටතේ සෑම ගමකටම වර්ෂයකට නිවාස 25 බැගින් ඉදි කෙරෙනු ඇති බවට සඳහන් වන බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) සමස්ථයක් ලෙස රට තුළ ඉදිකර ඇති නව නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ කවර දිස්ත්‍රික්කවල කවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් ගම්මාන තුළද;

(iii) මෙම වැඩසටහන යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ ඉදිකර තිබෙන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරි වසම් කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0433/'09

2.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ මහ නගර සභා බල ප්‍රදේශයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0434/'09

3.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0435/'09

4.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0436/'09

5.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0437/'09

6.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0438/'09

7.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0439/'09

8.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?